**ශීර්ෂ 315 - උතුරු පළාත් සභාව - 2023**
**---------------------------------------------**

## 01. දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

### 1.1 දැක්ම

උතුරේ ජනතාවගේ අපේක්ෂා තෘප්තිමත් කිරීම උදෙසා යහපාලනය ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම මගින් ධරණීය සංවර්ධනය සහිතව සමෘද්ධිමත් බව ළඟා කර ගැනීමට අරමුණු කර ගැනීම.

### 1.2 මෙහෙවර

ජීවනෝපාය නැවත පිහිටුවීම මඟින් සේවා හා යටිතල පහසුකම් නැවත සක්‍රීය කිරීම සමඟ උතුරු පළාතේ ජනතාව ඉලක්ක කර ගනිමින් යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා මානව සම්පත් සංවර්ධනය

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනය සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ ප්‍රතිපාදනවලට අනුව කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම.

## 02. මූල්‍ය ප්‍රකාශන

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

උතුරු පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 40,855,75 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 37,550.93ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 3,304.82 ක් හෙවත් සියයට 8 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2023 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 36,324.00 | 34,064.02 | 2,259.98 | 6.22 |
| මූලධන | 4,531.75 | 3,486.91 | 1,044.84 | 23 |
| **එකතුව** | **40,855.75** | **37,550.93** | **3,304.82** | **08** |

## 03. විගණන නිරීක්ෂණ

පාර්ලිමේන්තුව විසින් ඉහත ශීර්ෂය යටතේ ලබාදුන් ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ ගිණුම්ගත කරන ලද අතර ඒ අනුව එම ප්‍රතිපාදන උපයෝජනය කරන ලදි. පළාත් සභා අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.